Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති, ඒ තනතුරට ඉදිරියෙන් දක්වා ඇති සුදුසුකම් සහිත අයගෙන් 2019.07.26 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ප්‍රමාණය | වැටුප් ප්‍රමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් | බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු | 02 | රා. පරි.චක්‍රලේඛ 3/2016 අනුව PL1 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබිය යුතුය. | තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ප්‍රමාණය | වැටුප් ප්‍රමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් | බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|---|---|
| 02 | පුස්තකාල සහායක | 01 | රා. පරි.චක්‍රලේඛ 3/2016 අනුව PL1 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු. 36,410 | අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙ-වරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්වී තිබීම, (මින් විෂයයන් පහ (05) ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි. | තනතුරේ රාජකාරි ඉටු කිරීම ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |
| 03 | රියදුරු | 02 | රා. පරි.චක්‍රලේඛ 3/2016 අනුව PL3 රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | බාහිර අයදුම්කරුවන් සඳහා<br>අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙ-වරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය-යුතුය.<br><br>අභ්‍යන්තර අයදුම්කරු-වන් සඳහා<br><br>දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදළ ආයතනයේ ස්ථිර තනතුරක් දරන දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර සමත් විය යුතුය.) | තාරබර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්-වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. ( A පන්තියේ රියදුරු බලපත්‍රයක්)<br><br>වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරද්ද-ක් තිබිය යුතුය. (සේවා සහතිකය මගින් සනාථ කළ යුතු වේ.) | වෘත්තීය පරීක්ෂණයක් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් |

*03. බඳවා ගැනීම සඳහා වන පොදු කොන්දේසි :*

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

II. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

III. සෑම අයදුම්කරුවෙක්ම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ වයඹ පළාතෙහි ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

V. සියලුම තනතුරු සඳහා අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.

VI. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

VII. රාජ්‍ය සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

VIII. කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ දැනටමත් අනියම් ආදේශක හෝ ව්‍යාපෘති මට්ටමේ සේවයේ යෙදෙන සතුටුදායක සේවා තත්වයකින් යුතු අය කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

IX. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන අතර අදාළ විය හැකි සාධාරණ හේතු මත මෙම නිවේදනය සංශෝධනය කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අරමුදල යටතේ වන දායක මුදල් ගෙවිය යුතුය.

II. පත්වීමේ දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂක කාල සීමාවකට යටත්ව වේ.

III. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව, ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද, ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද හා මුදල් රෙගුලාසිවලටද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද වයඹ පළාත් සභාවේ හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමටද බැඳී සිටිය යුතුය.

IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

05. අයදුම්පත් එවිය යුතු පිළිවෙළ - සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම් පතක් 2019.07.26 දිනට පෙර ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, කොබෙයිගනේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනුපිටපත් ඇමිණිය යුතුය:

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. හැඳුනුම්පතේ පිටපතක්,
4. ග්‍රාම නිලධාරි සහතිකය,
5. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් නම් සේවා සහතිකය.

ලේකම්,
කෙබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

2019 ජූලි මස 05 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

## ආදර්ශ අයදුම්පත්‍රය

*වයඹ පළාත් රාජ්‍ය සේවයේ කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ (III) ශ්‍රේණියේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම*

01. (I) මුලකුරු සමග නම :——————————————.

(II) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————

02. ලිපිනය :——————————————

03. මැතිවරණ කොට්ඨාසය :——————————————

04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————

05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————

07. උපන් දිනය වර්ෂය :—————— මාසය:—————— දිනය:——————

08. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු:—————— මාස:—————— දින:——————

09. විවාහක/අවිවාහක බව :——————————————.

10. ජාතිය :——————————————.

11. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————————————.

12. අධ්‍යාපන සුදුසුකම් ::——————————————.

විභාගය :——————

පෙනී සිටි වර්ෂය :—————— විභාග අංකය:——————

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

13. වෙනත් සුදුසුකම් :............................................................................................................
..................................................................................................................................

14. ඔබ කවද හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :———————.

15. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත් හෝ පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

———————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :———————.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හොඳින් දන්නා හඳුනන බවත්, ඔහුගේ අත්සන .......................................දින මා ඉදිරිපිට දී තබන ලද බවත් සහතික කරමි.

———————.

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :———————

සම්පූර්ණ නම :———————

තනතුර :———————

ලිපිනය :———————

(නිල මුද්‍රාව තැබිය යුතුය.)

17. *දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.............................................. මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

———————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :———————

පදවි නාමය :———————

දෙපාර්තමේන්තුව/ආයතනය :———————

(නිල මුද්‍රාව තබන්න.)